දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2013 පරීක්ෂණය - 2016 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part II 2013 Examination – January/February 2016

# දේවිසා 3.2 - ජාත්‍යන්තර සම්බන්ධතා
# PSG 3.2 - International Relations

**කාලය පැය තුන යි**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

01. ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයනයේ ස්වභාවය (Nature) සහ විෂය ක්ෂේත්‍රය (Subject scope) පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

02. ජාතික දේශපාලනය හා ජාත්‍යන්තර දේශපාලනය අතර වෙනස පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

03. ජාත්‍යන්තර පද්ධතිය තුල රාජ්‍යයන් වර්ගීකරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

04. "ජාතික ආරක්ෂාව (National Security) ලොකු කුඩා ඕනෑම රාජ්‍යයක ප්‍රධාන ජාතික ආශාව වන්නේය" සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

05. "ජාතික බලය" යන්න පැහැදිලි කොට එය තීරණයවීම කෙරේ බලපාන ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.

(ලකුණු 20 යි)

06. "අන්තර් රාජ්‍ය සම්බන්ධතා පැවැත්වීමෙ උපකරණයක් වශයෙන් තානාපති වරයාගේ කාර්ය භාරය වර්ධනය වී ඇත." විභාග කරන්න.

(ලකුණු 20 යි)

07. "වඩා හොඳ ජාත්‍යන්තර පද්ධතියක් ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ප්‍රමුඛ කාර්ය භාරයක් හිමි වී ඇත." සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

08. රාජ්‍යයන්හි බාහිර අරමුණු ඉටුකර ගැනීමේ උපකරණයක් වශයෙන් "යුද්ධය" (War) කොතරම් දුරට වැදගත් වී තිබේ ද? විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20 යි)

09. "අන්තර් රාජ්‍ය සබඳතා පැවැත්වීමේ විධිමත් උපකරණයක් වශයෙන් රාජ්‍යයකට විදේශ ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ." පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

10. පහත සඳහන් මාතෘකා දෙකක් 02 පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. අයි.එස්.අයි.එස්. (I.S.I.S.) සංවිධානය හා ස්ලාමීය මූලධර්මවාදය
ii. සාමූහික සුරක්ෂිතතාවය
iii. අන්තර්ජාතික නීතිය
iv. නිරායුධකරණය හා අවිපාලනය

(එක් කොටසකට ලකුණු 10 බැගින්)

❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖❖